# උත්ථාන සමයේ සතරවන සතිය
# සෙනසුරාදා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියාපොතෙන් ගත් පාඨයෙකි ක්‍රියා 13: 44–52

**"අපි අන්‍ය ජාතීන් වෙත හැරෙමු"**

ඊළඟ සබත් දිනයේ දී දෙවියන් වහන්සේගේ වචනය අසන පිණිස නුවර වැසි සියල්ලෝම වාගේ රැස් වූහ. එහෙත් ජුදෙව්වරු එම ජනකාය දැක, ඊර්ෂ්‍යාවෙන් පිරී, පාවුළු කී කාරණා වලට විරුද්ධව කතා කරමින් අපහාස කළහ. එවිට පාවුළු ද බාර්ණබස් ද එඩිතරව කතා කරමින් මෙසේ කීහ. "දෙවියන් වහන්සේගේ වචනය පළමුකොට ඔබට ප්‍රකාශ කළයුතුව තිබිණි. එහෙත් ඔබ එය ප්‍රතික්ෂේප කොට, සදාතන ජීවනයට ඔබ නුසුදුස්සන් බව ඔබම නිශ්චය කර ගත්තා හෙයින්, මෙන්න අපි විජාතීන් වෙතට හැරෙමු. මන්ද, ස්වාමින් වහන්සේ අපට මෙසේ අණ කළ සේක.

'ලොව පුරා ගැළවීම ගෙන දෙන පිණිස විජාතීන් අතර
පහන් එළියක් ලෙස මම ඔබ තැබුවෙමි'

විජාතීහු ඒ අසා සන්තෝෂව, දෙවියන් වහන්සේගේ වචනයට ගෞරව කළහ. සදාතන ජීවනය ලැබීමට තෝරා ගන්නා ලද සියල්ලෝම අදහා ගත්හ. ස්වාමින් වහන්සේගේ දහම ඒ පළාත මුළුල්ලෙහි පැතිරී ගියේය. එහෙත් ජුදෙව්වරු සැදැහැවත් කුල ස්ත්‍රීන් ද නුවර ප්‍රභූන් ද පොළඹවා, පාවුළු සහ බාර්ණබස්ට විරුද්ධව පීඩනයක් ඇති කර තමන්ගේ පෙදෙස්වලින් ඔවුන් පිටතට නෙරපා දැමූහ. එවිට ඔව්හු තමන්ගේ පාදවල දූවිලි ඔවුන්ට විරුද්ධව ගසා දමා ඉකෝනියට ගියහ. ගෝලයෝ ප්‍රීතියෙන් ද ශුද්ධාත්මයාණන්ගෙන් ද පූර්ණ වූහ.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 98 : 1–4

පිළිතුර: මිහිපිට සියලු දෙන අප දෙවිඳුන්ගේ ජයග්‍රහණය දුටුවෝය.

ගීය:

සමිඳුන්ට නව ගීයක් ගයන්න. මන්ද, එතුමාණෝ අසිරිමත් ක්‍රියා කළ සේක. සිය බලයෙන් හා ශුද්ධ ශක්තියෙන් ජයග්‍රහණය ලත් සේක. සමිඳාණෝ ස්වකීය ජයග්‍රහණය ප්‍රකාශ කළ සේක.

විජාතීන්ගේ ඇස් හමුයෙහි සිය විමුක්ති බලය එළිදරව් කළ සේක. එතුමාණෝ ඉශ්රායෙල් වංශය කෙරෙහි එතුමන්ගේ ප්‍රේමයත් විශ්වාසකමත් සිහි කළ සේක. මිහි පිට සියලු දෙන අප දෙවිඳුන්ගේ ජයග්‍රහණය දුටුවෝය.

එම්බා ලෝ වැසි සියල්ලෙනි. සමිඳුන් හට ප්‍රීතියෙන් ගී ගයන්න. ප්‍රීති ගී ගයමින් එතුමන් පසසන්න.

## සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
"මෙසේ ක්‍රිස්තුස් වහන්සේ වද විඳිය යුතු බවත්
තුන් වනදා මළවුන්ගෙන් නැගිටිය යුතු බවත්
ශුද්ධ ලියැවිල්ලේ ලියා ඇත්තේය."
ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 14: 7-14

**"මා දුටු තැනැත්තේ පියාණන් වහන්සේ දුටුවේය."**

"ඔබ මා හඳුනන්නහු නම්, මාගේ පියාණන් වහන්සේත් හඳුනන්නහු ය. මෙතැන් පටන් ඔබ උන්වහන්සේ හඳුනන්නහුය. උන්වහන්සේ දැක ඇතැ" යි වදාළ සේක. පිලිප් කතා කොට "ස්වාමිනි, පියාණන් වහන්සේ අපට පෙන්වා වදාළ මැනව. එය අපට හොඳටම ඇතැ" යි උන්වහන්සේට කීය. ජේසුස් වහන්සේ පිළිතුරු දෙමින් "පිලිප්, මෙපමණ කලක් මා ඔබ සමග විසූ නමුදු තවමත් ඔබ මා හඳුනන්නේ නැද්ද? මා දුටු තැනැත්තේ පියාණන් වහන්සේ දුටුවේය. එසේ නම් පියාණන් වහන්සේ අපට පෙන්වා වදාල මැනැවැ" යි ඔබ කියන්නේ කෙසේද? මා පියාණන් වහන්සේ තුළ පියාණන් වහන්සේ මා තුළ ද සිටින බව ඔබ විශ්වාස නොකරන්නෙහි ද? මා ඔබ හට වදාරන වචන මාගේම අධිකාරි බලයෙන් නොවදාරමි. පියාණන් වහන්සේම මා තුළ වැඩ වසමින් ස්වකීය ක්‍රියා ඉටු කරන සේක. මා පියාණන් වහන්සේ තුළ ද පියාණන් වහන්සේ මා තුළ ද සිටින බවට මාගේ වචනය විශ්වාස කරන්න. එසේ නැත්නම් මාගේ ක්‍රියා නිසාවත් විශ්වාස කරන්න".

ඒකාන්තයෙන්ම මම මෙසේ ඔබට කියමි. මා අදහන්නා මා කරන ක්‍රියා ද කරන්නේය. තවද, මා පියාණන් වහන්සේ වෙතට වඩනා බැවින් ඔහු මීටත් වඩා මහත් ක්‍රියා කරන්නේය. පුත්‍රයා තුළ පියාණන් වහන්සේ මහිමයට පමුණුවනු ලබන පිණිස ඔබ මාගේ නාමයෙන් අයදින කවර දෙයක් වුවද මම ඉටු කරන්නෙමි".

"ඔබ මාගේ නාමයෙන් අයදින කවර දෙයක් වුවද මම ඉටු කරන්නෙමි" යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේය.